1 වන පිටුවෙන්

# අන්තො ජටා බහි ජටා

එක්සත් ජාතීන්ගේ ප්‍රශ්නයට අමතරව අප රටේ බොහෝ දේ අවුල්ව ඇති සැටි පෙනේ.

## එළවළු විසිකිරීම

නුවර එළියේ ගොවීන් විසින් වගාකර රට පුරා බෙදාහරින්ට වෙළඳ අමාත්‍යාංශයට බාරදුන් ටොන් දහස් ගණනක් එළවළු විකුණාගත නොහැකිව ලොරි පිටින් ගෙනගොස් වළවල් කපා එම වළවල්වලට හලා විනාශ කරන අන්දම දැක්වෙන පින්තූර පුවත් පත්වල පළවී තිබෙනු දුටුවෙමි. එයට යොදා තිබුණු ශීර්ෂ පාඨ වූයේ **මේවා හෙණගහන අපරාධ** යන්නය. සැබැවින්ම ඒ ක්‍රියාව මහා අපරාධයකි. ඒ එළවළු වවන්නට කොපමණ පෝර යොදන්නට ඇද්ද? එමෙන්ම ගොවීන් කොතරම් මහන්සි වන්නට ඇද්ද? රට පුරා ප්‍රධාන නගරවල එළවලු හිඟයක් පවතී. තිබෙන එළවලුද මිළෙන් අධිකය. එසේ වෙද්දී මේ ආකාරයෙන් එළවළු විනාස කරන්නේ ඇයිදැයි සොයාබලන්නට වෙළඳ ඇමතිවරයාවත් පියවරක් ගෙන නැත. මෙසේ වන බව ඔහු දන්නේ වත් නැත. මේ අවුල් සහගත තත්වයට පිළියමක් නැත. පසුගිය කාලයේ කේරලයෙන් ගෙනා පොල්ගෙඩි ලක්ෂ ගණනක් ගොඩට බාන්නේ නැතුව වරාය තුළම තිබී ඒ සියල්ල කුණුවී ඉවත දමන්නට සිදුවූ බව ඇසුවෙමු.

## මාලු කඩේ අවුල

පිටකොටුවේ තිබුණු සාන්ත ජෝන් මාලු මාර්කට් එක වඩා හොඳ බොහෝ පහසුකම් ඇති තැනක් වන පැලියගොඩට ගෙන ගියේ වඩාත් පුළුල් සේවයක් ජනතාවට ලබාදීමේ අරමුණ ඇතිවය. ඒ සඳහා විශාල වියදමක්ද රජය දැරුවේය. කොළඹ නගරයට නව හිතකාමී මුහුණු වරක් දීමටද, කොළඹ එතෙක් තිබූ පිළිකුල් සහගත අපවිත්‍රබව තුරන්කර කොළඹ පිරිසිදු, එමෙන්ම සංචාරකයින්ට ආකර්ෂණීය තැනක් කරන්නට යාමේදී පැරණි ගරා වැටුණු ගොඩනැගිලි කඩා දමා අළුත් ඒවා ඉදිකරන්නට හෝ නව ගොඩ නැගිල්ලකට ගෙන යාම හෝ කළ යුතුවෙයි. මේ සියල්ල ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතාගේ අනුදැනීම යටතේ සිදුවන දැය. මාලුකඩය පැලියගොඩට ගෙනයෑම ද ඒ ව්‍යාපෘතියේම කොටසකි. එහෙත් වූයේ නොසිතූ අවුලකි. රජයේම එක්තරා ඇමතිවරයෙකුගේ මැර කල්ලියක් ඒ ඉදිකළ නව මාලු වෙළඳ සංකීර්ණයේ වෙළෙන්දන් බියගන්වා කප්පම් එකතුකරන්නට වීමයි. අවසන සියල්ල යථා තත්වයට පත්කරන්නට හමුදා හටයින් යොදවන්නට සිදුවිය. මේ කාරණා වලින් හොඳින් පෙනී යන්නේ ඇතුළත අවුල්ය. රජයක් ඇතුළත තවත් රජයක් ක්‍රියාත්මක වෙනවා සෙයක් පෙනේ.

## විපක්ෂයේ අවුල්

ශ්‍රීලංකාවේ විපක්ෂය දැන් කාලයක් තිස්සේ සිට තිබෙන්නේ අස්ථාවර අවුල් සහගත තත්වයකය. එහි නායකත්වය වෙනස් කළ යුතුයයි පක්ෂයේ බොහෝ කණිෂ්ට පමණක් නොව ජ්‍යෙෂ්ඨ සාමාජිකයින්ද නිතර කියන කරුණකි. නායකත්වය තරුණ පෙළේ කෙනෙකුට දෙන්න යයි පක්ෂයේ ප්‍රබලයෝ එක්සත් ජාතික පක්ෂයේ වර්තමාන නායක රනිල් වික්‍රමසිංහ මහතාට කොතෙක් කීවද එයට රනිල් කැමති නැත. කලින් කලට එක් එක් ජනප්‍රිය තරුණයෙකු මැදිකරගෙන අළුත් නායකත්වයක් ගොඩ නගන්නට සමහර කණ්ඩායම් මහන්සි ගත්තද ඒ කිසිවක් සිදු වුණේ ද නැත. මේ කාරණා නිසාම එක්සත් ජාතික පක්ෂයේ සිටි බොහෝ මන්ත්‍රීවරු ආණ්ඩු පක්ෂයට පැනගත්හ. සජිත් ප්‍රේමදාස මහතාට පාක්ෂිකයන්ගේ කැමැත්තක් තිබුණද ඔහු නියෝජ්‍ය තනතුර ලැබුවද නිදහසේ යමක් කරන්නට ඔහුට ඉඩක් නොලැබේ. ඇතුළත අවුල් සියල්ලටම මුලය.

## නැව් නොඑන හම්බන්තොට වරාය

විශාල මහන්සියක් ගෙන විශාල වියදමක් දරා විශාල බලාපොරොත්තු ඇතුව හම්බන්තොට වරාය තැනූ සැටි අපි දනිමු. ඉදහිට හෝ නැවක් එන්නේ නැත්නම් වරායක් තැනීමෙන් ඇති ප්‍රයෝජනය කිම? වරාය නරඹන්නට යන අයට ඇතුළට



ඔසාමා බින් ලාඩන්

කැඳවාගෙන ගොස් එහි ක්‍රියාකාරීත්වය හා විපුල ප්‍රයෝජන ආදිය ගැනද ජනතාව දැනුම්වත් කරන මීඩියා ඒකකද එහි වීය. ඒ වරාය හදන්නට මුල් ගල් තැබූ අවධියේය. එහෙත් ඒ කියා දුන් දේවල් කිසිවක් සිදුවන බවක් නම් නොපෙනේ.

හම්බන්තොට වරාය නිසා කොළඹ වරාය පාලුවට යන බවක් සමහරු කියනු අපි ඇසුවෙමු. සමහර විටක එහි සත්‍යතාවක් තිබිය හැකිය. වරාය තනා සම්පූර්ණ කළාට පසු එය ක්‍රියාත්මක වන්නේ නැත්නම් එතැන අවුලක් ඇති බව පෙනෙයි.

දැන් අළුතින් ලැබෙන පුවත නම් හම්බන්තොට වරාය තුළට නැව් එන්නට තැනූ ක්ෂෙත්‍රයේ ගලක් මතුවී තිබෙන බවයි. දැන් රජය ඒ ගල කඩාදමන්නට සූදානම් වන බවක්ද පැවසේ.

## විශ්‍රාම වැටුප් අවුල

ශ්‍රීලංකාවේ පුද්ගලික අංශයට ද විශ්‍රාම වැටුප් ක්‍රමයක් සලසන්නට රජය මේ ළඟදී සැළසුම් කළත් එහි අවුල් සහගත තත්වයක් මතුවූ නිසා එය ක්‍රියාත්මක කළ නොහැකි තත්වයකට වැටී ඇත. මෙම විශ්‍රාම වැටුප් ක්‍රමයට විරෝධය පාන අය අතර මූලිකත්වය ගෙන ඇත්තේ වාමාංශික වෘත්තීය සමිතිය. එයට හේතුව මෙයයි. විශ්‍රාම වැටුප් ක්‍රමය පණගන්වන්නට අරමුදලක් අවශ්‍යය. රජය ලැස්තිවූයේ සේවක අර්ථසාධක අරමුදලේ මුදල් ඒ සඳහා ගන්නටය. එය කිසිසේත් නොකළ යුතුයයි වෘත්තීය සමිති කියයි. වෙන කොහෙන් මුදල් ගත්තත් සේවකයන්ගේ අර්ථසාධක මුදලට අත තියන්නට එපා-යයි ඔව්හු දැඩිව කියති.

## තානාපති සේවයේ අවුල්

තානාපති සේවය සඳහා නිලධාරීන් පත්කිරීමේදී කලින් සිරිත වූයේ විදේශ අමාත්‍යාංශය මගින් වෘත්තීය වශයෙන් පුහුණුව ලැබූ නිලධාරීන් ඒ සඳහා යැවීමය. එහෙත් දේශපාලන ක්‍රමය අප රටේ වෙනස් වෙත්ම ඒ සමගම නිලධාරීන් පත්කිරීමේ ක්‍රමයද වෙනස් වන්නට වීය. සමහර විට තානාපතිවරයෙකුට සුදුසුකම් නැති අය පවා දේශපාලන දැන හැඳිනුම්කම් මත යවන ලද අවස්ථා එමටය. ශ්‍රීලංකාවට මෑතක සිට විදේශීය තර්ජණ ගර්ජන එල්ල වන්නට හිටියාට පසු භාෂාව හැසිරවීම, තැනට සුදුසු නුවණ හා මුඛරිකම යන අංගයන් ගෙන් සමන්විත තානාපතීන් අවශ්‍යබව හැඟෙන්නට වීය. ඒ කෙසේ වෙතත් මේ ළඟදී අළුත් තානාපතිවරු දොළොස් දෙනෙකු රට රටවලට ලංකාවෙන් පත්කර යවා ඇති බව දැනගන්නට ඇත. එහෙත් ගිය දෙසැම්බර් මාසයේ මහකොමසාරිස් නිහාල් ජයසිංහ මහතා ඉවත්ව ගිය පසු ඒ තැනට තවමත් මහකොමසාරිස්-වරයෙකු පත්කර එවා නැත. දැන් ලන්ඩනයේ ඒ තනතුරේ වැඩබලන්නේ නියෝජ්‍ය මහකොමසාරිස් හම්සා මහතාය. එක්සත් රාජධානියට තවමත් මහකොමසාරිස් වරයෙකු නැත්තේ ඇයි? මෙයට පිළිතුරක් කිසිවෙක් නොදනිති.

මෙතෙක් මා පැහැදිලි කළේ අන්තො ජටා බහි ජටා තත්වය මත අද දවසේ අපේ රටේ සියල්ල අවුල් සහගත තත්වයක පවතින සැටිය. තව උදාහරණ සිය ගණනක් පෙන්වා දිය හැකිය. මේ ඇමරිකාව ලංකාවට කළ එක් චෝදනාවක් නම් කොටි සාමාජිකයන් සුදු කොඩි ඔසවාගෙන එද්දී හමුදාව වෙඩි තැබුවාය කියන කතාවයි. එය එසේ නො-වේයයි කීවත් ඔවුන් පිළිගන්නේම නැත. එසේනම් ඇමරිකාව ආයුධ කිසිවක් අත නැති බින් ලාඩන් අත් අඩංගුවට නොගෙන මරාදැමුවේ ඇයිදැයි ඇමරිකාවෙන් ඇසිය යුතුයයි බොහෝ අය කියති. හොඳම සාක්ෂිය මේ පින්තූරයයි. අත්අඩංගුවට නොගෙන හතුරා මරාදමන්නට අණ දුන් ජනාධිපති හතුරා අතේ ආයුධත් නැතිව මරා දමන ආකාරයද වාඩිවී බලා හිඳී.



බැංකි මූන්

තත්වය මුළු ලෙවටම පොදුව යන්නක් බව අනෙක් රටවල ද පවතින අවුල් වලින් පෙනේ.

අද ලෝකයේ අධ්‍යාපන ක්‍රමය අවුල්ය. ආර්ථිකය අවුල්ය. සදාචාරය අවුල්ය. ක්‍රීඩාව අවුල් ය. වෙළහෙළදාම අවුල්ය. කර්මාන්ත අවුල්ය. ගැහැණු පිරිමි සබඳතා අවුල් ය. භාෂාව අවුල් ය. සංගීතය හා සිනමාව අවුල්ය. කාල ගුණය හා දේශගුණය අවුල් ය. වායු ගෝලය අවුල්ය. ආගම දහම අවුල්ය. අවුල් නැති දෙයක් නැත. අවුල් ඇතුළතින් හා පිටතින්ද වන කල මනුෂ්‍යයා කුමක් කරන්නද? ඔහුට බේරෙන්නට විදියක් ඇත්තේම නැත.

මේ තත්වය අද පමණක් නොව එදාද වූයේය. එසේ නම් මෙය හැමදාටම පවතින පොදු ධර්මතාවක් විය යුතුය. එහෙත් අවුලින් මිදෙන්නට මගක් සොයන්නට සිදුවෙයි.

කෝ ඉමං විජටයේ ජටං යනුවෙන් බ්‍රාහ්මණයා අවසන ඇසූ ප්‍රශ්නය "මේ අවුල විසඳිය හැක්කේ කාටද?" යන්නයි. එයට ගෞතමයන් වහන්සේ දුන් පිළිතුර වූයේ 'සීලෙ පතිට්ඨාව නරො සපඤ්ඤො' යනුයි අර්ථය - හික්මීම ඇති ප්‍රඥාවන්ත මනුෂ්‍යයින් විසින් යන්නයි

දැන් අපට වැටහේ. අවුලක් විසඳන්නට හැක්කේ දැඩි හික්මීමක් ඇති ප්‍රඥාවන්තයින්ට පමණක් බවය. ප්‍රශ්න විසඳමින් රටවල් පාලනය කරන්නට අවශ්‍ය වන්නේ හික්මීම සහ ප්‍රඥාවය. ඒ දෙක නැති වූ විට මිනිස් සමාජය විනාශවී යන්නේය.

♦ **කීර්ති ජයසුන්දර**



## ඔබාමා හිලරි ඇතුලු පිරිස බින් ලාඩන්ගේ අවසාන මොහොත සිදුවනු නරඹති

**මේ** ඉහතකී පින්තූරයෙන් දැක්වෙන්නේ ඇමරිකානු ජනාධිපති බැරක් ඔබාමා සහ රාජ්‍ය ලේකම් හිලරි ක්ලින්ටන් ඇතුළු ඇමරිකානු රජයේ ඉහළ නිලධාරීන් පිරිසක් ජනාධිපති කාර්යාලයේ සිට ඇමරිකානු නාවුක හටකණ්ඩායම පකිස්ථානයේ ඔසාමා බින්ලාඩන් සැඟවී සිටි තැනට ගොස් ඔහු ඝාතනය කරන අන්දම ඉතා විමසිලිමත්ව ටෙලිවිෂන් තිරයේ බලා සිටින ආකාරයයි.

බින් ලාඩන් වටලන ක්‍රියාන්විතය සඳහා පකිස්ථානයට ගිය ඇමරිකානු හට කණ්ඩායමේ හටයින්ගේ හිසේ පළඳින හෙල්මට් එකට සවිකළ කැමරා තිබුණි. එම ක්‍රියාන්විතයේ සියළුම අවස්ථාවන් ඒ මගින් විඩියෝකරණය කොට සැටලයිට් මාර්ගයෙන් එය ඇමරිකාවේ ජනාධිපති ධවල මන්දිරයට එවන ලදී. එදා බින්ලාඩන් මරණ මොහොතේ වූ සියළුම දේවල් ඒ පටිගතකිරීමේ අඩංගු බවට සැක නැත. ඇමරිකානු හටයින් බින් ලාඩන් කුමන අන්දමට මරාදැමුවාදැයි කියන්නට නොහැකිය. ඇමරිකානුන් තද හිත් ඇතියවුන් බව ප්‍රකට කරුණකි. ඒ දෙස බලාගෙන ඉන්නා පිරිසෙන් හිලරි ක්ලින්ටන් පමණක් අනේ අපොයි කියන්නාක් මෙන් කම්මුලට අත තබාගෙන සිටින්නේ ඒ දකිනා දෙයින් කාන්තාවක් වන ඇය මහත්සේ කැළඹී සිටි නිසා බවට සැක නැත.

බින් ලාඩන් මැරුවාට පසු ඇමරිකාව ද අවුල් සහගත තත්වයකට පත්ව සිටී. බින් ලාඩන් නිරායුධව සිටි බවත්, ඔහු මැරුවාට පසු මිනිය මුහුදට විසිකර දැමූ බවත් සැලවෙත්ම බොහෝ දෙනා විරෝධය පාන්නට වී ඇත. එංගලන්තයේ කැන්ටබරි ආච්බිෂොප්වරයා නිරායුධ මිනිහෙක් ළඟටම ගොස් මරා දැමීම ගැනත් මිනිය සාමාන්‍ය සිරිත ලෙස පවුලේ අයට බාර නොදී මුහුදට දැමීම ගැනත් ජනාධිපති ඔබාමාට දැඩි ලෙස දොස් කීවේය. බින් ලාඩන් පමණක් නොව ඔහු සමග මැරුම් කෑ සිව්දෙනාගෙන් කිසි-වෙකු ළඟ අයුධ කිසිවක් තිබී නැති බව දැන් ඔප්පු වී ඇත.

## නව ක්‍රිකට් නායක ඩිල්ෂාන්





ජනප්‍රිය ක්‍රිකට් ක්‍රීඩක තිලකරත්න ඩිල්ෂාන් නවතම ශ්‍රීලංකා ක්‍රිකට් නායක ලෙස පත්වුණු පසු සිය බිරිඳ සහ පවුලේ අය සමග කලුතර මහා බෝධියට ගොස් පූජාවක් පවත්වා පිරිත් සජ්ජායනය කින් අනතුරුව සංඝයාවහන්සේලාගේ ආශීර්වාදය ලබා ගත් අයුරු මෙහි දැක්වේ.